

(මෙම ටෙලි නාට්‍යය හිරිමල් යෞවනයේ චමත්කාරය, සහෝදරත්වයේ අපරිමිත බැඳීම සමග කැටිවුනු යොවුන් ප්‍රේමයේ අසිරිය අතිනතගත් නිර්මාණයක්. එමෙන්ම මෙය ශ්‍රීලාංකීය ටෙලිනාට්‍යයක මෙතෙක් නොවූ විරූ ආකාරයේ ආදර කතාවක් සහිත අපූර්ව චරිත සමූහයක් කැටිකරගත් වෙනස්ම ආකාරයේ රූපවාහිනී අත්දැකීමක් ප්‍රේක්ෂක සහෘදයා වෙත ගෙන එන ටෙලි නිර්මාණයකි. එසේම සංගීතය, තාරුණ්‍යයේ දඟකාරකම් වලින් සුන්දර වූ මෙම ටෙලිනාට්‍යය පවුලේ සැමට පිදෙන සොඳුරු තිළිණයකි)

ඇමැන්ඩා (අමන්දා) පුංචිහේවා, වාණිජවේදී උපාධිධාරි, විසිපස් වියැති රූමත් තරුණියක්. ඇය එතරම් වත්පොහොසත්කම් නොමැති පවුලක වැඩිමහළු දියණියයි. ඇගේ පියා විශ්‍රාමික නැටුම් ගුරුවරයෙකු වන සේපාල පුංචිහේවා, දැනට රැකියාවක් නොකරන අතර කේන්දර බැලීම ඔහුගේ විනෝදාංශය මෙන්ම එකම ජීවනෝපායයි. වසර විසි පහකට පෙර ඔහුට ඇදුනු ලොතරැයි පතක දිනුමක් නිසා ලද මුදල යොදවමින් යම් තරමක හෝ පදිංචිව සිටි නිවහන ඉදිකර ඇත. පවුලේ විය හියදම් වල වගකීම දරන්නේ තරමක් සැර පරුෂ දැඩි ගති ඇති ඔහුගේ බිරිඳ ගර්ලිය. තවමත් පාසල් යන බ්‍රිටිනිගේ උසස් පෙළ නිමවා සිටින කැතීගෙත් මුදල් අවශ්‍යතා බොහෝමයක් සපයන්නේ සේපාලගේ විශ්‍රාම වැටුපෙනි.

කෙතරම් මිල මුදල් අරගල තිබුණත් සිය නිවස සතුට පිරුණු තැනක් කිරීමට උත්සාහ දරණ අමන්දා සැබැවින්ම දිරිය දියණියකි. එහෙත් ගර්ලි ඇය කෙරෙහි අනුගමනය කරන්නේ කිරි නිසා ඉවත දැමීය නොහැකි උණු නිසා බීමටත් නොහැකි ආකාරයේ ප්‍රතිපත්තියකි. මන්ද ඇය සිය ලෙයින් උපන් දියණියක් නොවන නිසාය. සේපාල හා ගර්ලි අතර පමණක් එය රහසක් ලෙස තබා ගැනීමට සේපාල දැඩි උත්සහයක යෙදෙයි. සේපාලට ලොතරැයි දිනුම ලැබුණේ අමන්දා නිවසට ගෙන ආ දින වලයි. එම නිසා ඇය තම පවුලට වාසනාව උදා කල බවක්ද ගර්ලිගේ සිතේ ඇත.

නාට්‍ය ආරම්භ වන්නේ රැකියාවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට යන අමන්දාට රැකියාව අහිමි වීමත් සමගය. ඇය ආයතනයෙන් පිටවී පාරට බසින්නේ ප්‍රශ්ණ කන්දරාවක් හිස දරා ගනිමිනි. ධනවත් ව්‍යාපාරිකයෙකු වන ඉන්ද්‍රජිත් දූණුසිංහගේ පුතා වන තේජාන් සිය මිතුරන් පිරිසක් හා විනෝද චාරිකාවක් යන අතර වාහනය නවතා මොහොතක් විනෝද වෙමින් සිටින්නේ ඇය ඇවිදිමින් එන මග අසලය. මෙහිදී ප්‍රථමයෙන් පාරේ එන තරුණියගේ නහය ඇල්ලීමට මිතුරන් කළ අභියෝගය තේජාන් භාර ගනී. තේජාන් කල නොහෙබිනා විහිළුව වටහා ගන්නා අමන්දා තේජාන්ට බැණ කෝපයෙන් ඔහුව තල්ලු කර දමා පිටව යයි. බිම ඇද වැටෙන තේජාන්ගේ එක් අතක තරමක විශාල තුවාලයක් ඇතිවේ.

**ලයිෆ්** නම් ප්‍රචාරණ ආයතනයේ ප්‍රධානී ඉන්ද්‍රජිත් දූණුසිංහ නම් ධනවත් ව්‍යාපාරිකයා සතුව සමාගම් කිහිපයකි. දූණුසිංහ නිතී ගරුක හා මනා කළමනාකරණයෙකින් යුතුව තම සේවකයන් කෙරෙහි මෙන්ම දරුවන් කෙරෙහිද කටයුතු කරන පුද්ගලයෙකි. ඔහුගේ බිරිඳ සැරපරුෂ ගති ඇති තම සැමියාගේ ජීවන රටාවට අනුගත වී දරුවන්ගේ වගකීම් දරන ගෘහණියකි. ඔවුන්ගේ වැඩිමහල් පුත් දේවක හිතුමනාපයට කර ගත් විවාහයක් නිසා පවුලෙන් ඉවත් වන්නට සිදු වී වෛද්‍ය වෘත්තියේ

නියැළෙමින් පිටරටක ජීවත් වේ. ඔහු හා කිසිදු සම්බන්ධතාවයක් පැවැත්වීමට මෙම පවුලේ කිසිවෙකුට දූණුසිංහගෙන් අවසරයක් නොමැත. සෙල්ලක්කාර ගති ගුණ ඇති විනෝදකාමී ගති ඇති තේජාන් ඔවුන්ගේ දෙවැනි පුත්‍රය. මිතුරන් ඇසුරත් සංගීතයත් පරම විනෝදාංශය කර ගත් ඔහු, පියාගේ ව්‍යාපාර කටයුතු වලින් ඈත්ව සිටීමට දැඩි උත්සාහයක නිරත වී සිටියි. පවුලේ එකම දියණිය තේජනී දඟනව වියැති තරමක් රැඩිකල් චරිතයකි. ඇය මනේන්ද්‍ර නම් තරුණ නාට්‍යකරුවෙකු සමග පෙම් සබඳතාවයක් ඇති කරගෙන සිටින්නේ ඔහුගේ දුප්පත්කම හෝ නොගැලපීම් නොතකමිනි. දූණුසිංහ නිවසේ තවත් විශේෂ චරිත දෙකකි. ඒ නිතරම දරුවෙකු ගැන කියමින් බෝනික්කකු තුරුළු කරගෙන යම් උමතු මානසිකත්වයකින් සිටින දූණුසිංහගේ නැගණිය වන වසන්ති හා ඇයව බලා කියා ගන්නා සේවිකාව වන අයිරි. වසන්තිගේ ජීවිතය වටා විශාල රහසක් ඇති බව දන්නේ දූණුසිංහ හා බිරිඳ කමනී පමණි.

පැරණි මිතුරියක් වන ඉන්ද්‍රජිත්ගේ දුව තේජනිගේ උපකාරය මත ලයිෆ් ආයතනයේ රැකියාවට එන අමන්දාට තේජාන් මුණ ගැසෙයි. තමා පෙර දින ගැටුමක් ඇති කර ගත් තරුණයා සැප පහසු කාමරයක වාඩි වී සිටිනු ඇය දකින්නේ එවිටය. අමන්දා තම ආයතනයේ සේවිකාවක් බව දැන ගන්නා තේජාන්ද ඇය හා දැඩි කෝපයක් ඇති කර ගනී. තේජාන් ඉන්ද්‍රජිත් දූණුසිංහගේ පුතා බව අමන්දා දැන ගන්නේද ඉන්පසුවය.

තේජාන් අමන්දාව රැකියාවෙන් ඉවත් කර වීමට නොයෙකුත් උපක්‍රම යොදයි. එහෙත් මේ අපූරු තරුණියගේ වැඩ වල පිළිවෙල සහ පෞරුෂය දකින දූණුසිංහ ඇයව තේජාන්ගේ පෞද්ගලික ලේකම් තනතුරට පත් කරන්නේ ඔහුව ව්‍යාපාර කටයුතු වලට යොමු කරවීමේ වගකීමද පවරමිනි. තමා ලෝකයේ අසතුටුම කාර්යය එය වුවත් ලැබෙන ඉහළ වැටුප ගැන සිතන ඇය එම තනතුර භාර ගනී. මෙයින් තේජාන්ගේ කෝපය තවත් වැඩි වෙයි. අමන්දා හා ප්‍රේම සම්බන්ධතාවක් ඇති කර ගන්නා ලෙස ඔහු කාර්යාලයේ තරුණයෙකුට බල කරන්නේ තම පියාගේ සිතෙහි ඇය කෙරෙහි ඇති පැහැදීම බිඳවීමටය. එහෙත් සැබවින්ම ඔහු (හේමන්ත) අමන්දාට ආදරය කරන නිසා තේජාන්ගේ උපක්‍රම වලට හසු නොවෙයි.

අමන්දාගේ නව රැකියාවත් සමග පවුලට ආර්ථික ස්ථාවරයක් ඇතිවෙයි. නිළියක් වීමේ සිහිනයක සිටින ඇගේ වැඩිමහල් නැගණිය කැතී ධනවත් තරුණියක සේ පෙනී සිටිමින් රූපලාවන්‍ය පාඨමාලාවකට සහභාගි වන අතර තේජනී එහිදී ඇගේ මිතුරියක වෙයි. කැතී තේජනීගේ හා මනේන්ද්‍රගේ පෙම් සබඳතාවට උදව් කරන්නේ ලයිෆ් ආයතනයේ වෙළඳ දැන්වීමකට සහභාගීවීමේ අවස්ථාව ලබා ගැනීමේ යටි අරමුණද ඇතිවය. අමන්දා තමා ලයිෆ් ආයතනයේ සේවය කරන බව නිවසට නොකියා සිටිමටද කැතීගේ මෙම නිළි පිස්සුව එක හේතුවකි. තේජනී කැතීගේ අවශ්‍යතාවය සිය පියා ලවා ඉටු කර ගැනීමට නොහැකි තැන කැතීව තේජාන්ට හඳුන්වා දෙයි. එතැන් සිට කැතී ඔහු හා ආදරෙන් බැඳෙන්නේ ඔහුගේ කඩවසම් බවට පමණක් නොව තමාගේ නිළි සිහිනය සැබෑ කර ගැනිමේ හොඳම මාවත තේජාන් බව සිතමිනි. එහෙත්, තේජාන් ඇගේ ආදරය නොතකයි. ඔහුට එයද එක්තරා දඟකාරකමකි.

කාර්යාලය තුල අමන්දා ඇති කරන නවතාවයත් තම ව්‍යාපාර කටයුතු වලට ලැබෙන සහයත් නිසා තේජාන්ගේ කෝපය තුරන්ව සුහදශීලී තත්වයක් ඇතිවේ. මෙය වැඩි කල් නොයවාම ආදරයක් බවට පත්වෙයි. මේ වන විට දූණුසිංහ නිවසේ සියළු දෙනාගේ ප්‍රසාදය දිනා සිටියත් අමන්දා තේජාන්ගේ ආදර ඉල්ලීම භාර ගැනීමට ඉක්මන් නොවන්නේ තම ආදරය සිතෙහි සඟවා ගනිමිනි.

මේ අතර තම නැගණිය කැතී තේජාන්ට දැඩි ලෙස ආදරය කරන බවත් ඒ තුල ඇගේ අනාගතයම රඳා පවතින බවත් දකින අමන්දා ඔවුන් දෙදෙනාට බාධකයක් නොවීමට තිරණය කර නිවසින් පලා යයි. මේ යන අතර දුර පළාතකදී ඇය රිය අනතුරකට ලක් වෙයි. වාහනයේ හිමිකරු ඇයව රෝහලට රැගෙන යයි. ඒ දේවකය. කාත් කවුරුත් නැති බව පවසන අමන්දාට සනීප වන තුරු ඇයව තම නිවසේ නවතා ගැනීමට දේවකට සිදු වෙයි. ඔහුගේ බිරිඳ පිටරටකදී හදිසි අසනීපයකින් මිය ගිය බවත් යළි ලංකාවට පැමිණි ඔහු කුඩා දියණිය හා තනිව ගෙවන හුදකලා දුක්බර ජිවිතය දකින අමන්දා ඔවුන් හා නොදැණුවත්වම ලෙංගතු වෙයි. එහෙත් ඔහු තේජාන්ගේ සොහොයුරා බව කිසිසේත් නොකියන්නේ තම පියාගේ විරෝධතාවය මත තමාව පවුලෙන් ඉවත් කල නිසාය.

අමන්දාගේ අතුරුදහන් වීමත් සමග ඇයව සොයා වෙහෙසෙන තේජාන් ඇය තබා ගිය ලිපියෙහි වන ඉල්ලීම පරිදී කැතීව විවාහ කර ගන්නේ ආදරයකින් නොවේ. තේජනීගේ බලපෑමද මෙම විවාහයට හේතු වෙයි. විවාහයත් සමග කැතීගේ නිළි සිහිනය සැබෑ වෙයි. එහෙත් ඔවුන් දෙදෙනාගේ විවාහ ජිවිතය අසාර්ථක වෙයි. තේජාන් කළකිරීමෙන් ජිවත් වෙයි.

මේ අතර දේවකගේ දියණිය මවකට මෙන් අමන්දාට ඇලුම් කරයි. දේවකගේ සිතේහිද ඇය කෙරෙහි විශාල පැහැදීමක් ඇති මුත් විවාහ යෝජනාවක් කිරීමට පසු බට වෙයි. දේවකගේ නිවසේ දී අමන්දාට පැරණි දින පොතක් හමු වෙයි. (එය දේවකගේ උමතු නැන්දණියගේය.) තමා ජිවිතයේ අත්විඳි සුන්දරම ආදර කතාව එය නිසා තමා එය ප්‍රවේශමෙන් තබා ගත් බව දේවක කියයි. අමන්දා ඔහුගෙන් අවසර ගෙන එය කියවයි. ඇයට දේවක වසන් කරන මෙම කාන්තාව කවුරුන්දැයි සොයා ගැනීමට දැඩි උවමනාවක් වෙයි. ඒ එම දින පොත හා නොහැගෙන ලෙන්ගතුකමක් තමාට දැනෙන නිසාවෙනි. ඇය දේවකගේ නිවසින් පිටව යාමට අවසර ඉල්ලයි. එහෙත් කුඩා දියණිය මේ වන විට අම්මා යැයි ආමන්ත්‍රණය කරන තරමට අමන්දා හා බැඳී අවසන්ය. දේවක ඇයට තමා හා විවාහ වන ලෙස යෝජනා කරන්නේ මේ අතරයි.
අසාර්ථක යුග දිවියත් අමන්දා නොමැති ශෝකයත් නිසා පිස්සෙකු සේ ජිවත් වන තේජාන්ට දේවක මුණ ගැහෙන්නේ අහඹු ලෙසිනි. මේ මුණ ගැසීමත් සමග දේවකගේ නිවසට එන තේජාන් හා අමන්දා යළි එකිනෙකා මුණ ගැසෙන්නේ නොසිතු මොහොතකයි.

මේ හමුවීමත් සමග අමාන්දා, තේජාන් යළි ආදරයෙන් බැඳෙයිද? දේවකගේ දියණියට යළි මව් සෙනෙහස අහිමි වේද? අමන්දා දින පොත ඔස්සේ තේජාන්ගේ නැන්දණිය තමාගේ සැබෑ මව බව සොයා ගනීවිද? යන මානුෂීය ගැටුළු රැසකට පිළිතුරු සොයමින් මෙම කතා මාලාව තිරය මත දිග හැරෙන්නේ කුතුහලය, සෞන්දර්යය මෙන්ම මානුෂීය සබඳතාවල අපුර්වත්වය විදහාපාන අපුරු ටෙලි නිර්මාණයක් ලෙසයි.